# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයට 3 වන පන්තියේ මගී හිස් ප්‍රවේශපත්‍ර (IIIrd CLASS BLANK PASSENGER TICKETS) 60,000,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනයයි

### ශ්‍රී ලංකා දුම්රිය සේවය - IFB No. - SRS F. 7993

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **ශ්‍රී ලංකා දුම්රිය සේවයට 3 වන පන්තියේ මගී හිස් ප්‍රවේශපත්‍ර 60,000,000ක් සැපයීම** වෙනුවෙන් සුදුසුකම්ලත් නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.ලංසුකරුවන් තම ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරන ලද ඇටෝර්නි බලයෙන් හෝ සෘජුව බලයලත් පිළිගත් නියෝජිතයෙකු හරහා විය යුතුය.

2. ලංසු කැඳවීම ජාත්‍යන්තර තරගකාරීත්ව ලංසු පටිපාටිය (ICB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට **2024.11.26** සිට **2025.01.08** දක්වා **පෙ.ව.9.00** සිට **ප.ව.3.00** දක්වා වැඩ කරන දිනයන්හිදී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩි දුර තොරතුරු ලබාගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන අංක** | **: +94 (11) 2438078 හෝ +94(11) 4600202** |
| **ෆැක්ස් අංකය** | **: +94(11) 2432044** |
| **ඊ මේල්** | **: srs.slr@gmail.com, tender1@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | **: www.railway.gov.lk** |

4. ලංසුකරුවන් විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉහත අයිතම සැපයීමේ අතීත වාර්තා සමගින් ඉහත අයිතම සැපයීමට ඇති හැකියාව පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ඉහත අයිතම සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරුට අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතු අතර එය සනාථ කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අදාළ සියලුම ලියකියවිලි වල ඡායා පිටපත් පැහැදිලි හා පරිශීලනය කළ හැකි විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.11.26** සිට **2025.01.08** දක්වා **ප.ව.3.00** (ශ්‍රී ලංකා වේලාවෙන්) තෙක් නැවත ගෙවනු නොලබන **රු.38,750/-** ක් හෝ පහසුවෙන් මාරුකළගතහැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකම ඇති ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

6. සෑම ලංසුවක්ම ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණ මුදල **රු.2,450,000.00** ක් විය යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් විය යුතුය.

7. **2025.01.09** දින **ප.ව.2.00** හෝ එදිනට පෙර පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත,**
**කොළඹ 10.**

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.
යොමු අංකය : SRS/ F.7993